25 ද(?)

# ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
# ஆரம்பக் கைத்தொழில் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
# MINISTRY OFPRIMARY INDUSTRIES AND SOCIAL EMPOWERMENT

මගේ අංකය :
எனது இல :MPI&SE/NSPD/1/44
My No.:

ඔබේ අංකය :
உமது இல:
Your No. :

දිනය:
திகதி:2019.10.18
Date :

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

අමාත්‍යාංශ චක්‍රලේඛ අංක
2019 / 03

## තනි මාපිය පවුල් සංවර්ධන වැඩසටහන යටතේ ස්වයංරැකියා ආධාර ලබා දීම

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන තනි මාපිය පවුල් සංවර්ධන වැඩසටහන යටතේ, අඩු ආදායම්ලාභී ඒක් තනි මාපිය පවුලකට රු. 30,000/- ක උපරිමයකට යටත්ව ස්වයංරැකියා ආධාරයක් ප්‍රදානය කරනු ලැබේ. ජීවන මඟෙහි අසරණ තත්ත්වයකට පත්ව සිටින තනි මාපියන් ස්වයංරැකියාව තුළින් ස්වෝත්සාහයෙන් නැඟී සිටිනු ඇතැයි මෙයින් අපේක්ෂා කරනු ලබන අතර, එයින් ලැබෙන ලාභය තුළින් පවුලේ ආර්ථික තත්ත්වය දියුණු කර ගැනීමටත්, දරුවන්ගේ සෞඛ්‍ය තත්ත්වය හා ජීවන තත්ත්වය සහපත් මට්ටමක පවත්වා ගැනීමටත්, සිය ආත්මාභිමානය ආරක්ෂා කර ගනිමින් සමාජයෙහි ජීවත් වීමටත් මෙයින් ඉමහත් පිටිවහලක් සැපයේ.

### මෙම ආධාරය ලබා ගැනීම සඳහා වන නිර්ණායක

- ඉල්ලුම්කරු වයස අවුරුදු 70 වඩා අඩු විය යුතු ය.
- පවුලේ මාසික ආදායම රු. 6,000/-ට වඩා අඩු විය යුතු ය.
- කලත්‍රයා මිය යාම / අත්හැර යාම / දීර්ඝකාලීනව බන්ධනාගාරගත වීම වැනි කරුණු මත තනි මාපියකු බවට පත් වූ අයකු විය යුතු ය.
- විවාහයකට නොඑළඹී දරුවකු ලැබූ මව්වරුන්ට ද මෙම ආධාරය ලැබීමට සුදුසුකම් ඇත.
- අවුරුදු 18 ට අඩු වයසේ දරුවන් සිටිය යුතු ය.
- ස්වයංරැකියාවක් කිරීමට සහ එයින් ආදායම් ඉපයීමට හැකියාවක් තිබිය යුතු ය.

### විශේෂ අවස්ථා

- තම දරුවකුගේ දරුවකු (මුණුබුරකු) සිය දෙමව්පියන් විසින් අත්හැර දමා යාම හේතුවෙන් එකී දරුවාගේ භාරකාරත්වය පැවරෙන සීයා / ආච්චි ද මෙම ආධාරය ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබන අතර තනි මාපියකු වීමේ අවශ්‍යතාව සලකා නොබැලේ.
- තම දෙමව්පියන් මිය යාම හෝ අත්හැර දමා යාම හෝ දීර්ඝකාලීනව බන්ධනාගාරගත වීම හේතුවෙන් බාල සොහොයුරකු / සොහොයුරියකගේ භාරකාරත්වය පැවරෙන වැඩිමහල් සොහොයුරකු / සොහොයුරියක ද මෙම ආධාරය ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබන අතර මෙහි දී තනි මාපියකු වීමේ අවශ්‍යතාව සලකා නොබැලේ.
- දරුවන් විවාහ වීම හෝ වෙනත් කරුණක් නිසා ඔවුන්ගෙන් වෙන්ව ජීවත් වන, දරුවන්ගෙන් සැලකුම් නොලබන තනි මාපියන්ට ද මෙම ආධාරය ලැබීමට සුදුසුකම් ඇත.

(අ.පි.බ.)


අමාත්‍ය/அமைச்சர்/Minister — දුරකථන/தொ.பே./Tel.: 011 - 2861 145 — ෆැක්ස් /பெக்ஸ்/Fax : 011 - 2884 613
රාජ්‍ය අමාත්‍ය/இராஜாங்க அமைச்சர்/ State Minister — දුරකථන/தொ.பே./Tel. :011-2877 841 — ෆැක්ස් /பெக்ஸ்/Fax : 011-2877 606
නියෝජ්‍ය අමාත්‍ය/ பிரதி அமைச்சர்/Deputy Minister — දුරකථන/தொ.பே./Tel. : 011 - 2877 121 — ෆැක්ස් /பெக்ஸ்/Fax : 011 - 2877 126
ලේකම්/செயலாளர்/Secretary — දුරකථන /தொ.பே./Tel. : 011 - 2883 525 — ෆැක්ස් /பெக்ஸ்/Fax : 011 - 2187 007
අමාත්‍යාංශ කාර්යාලය/அலுவலகம்/General Office — දුරකථන/தொ.பே./Tel. : 011 - 2887 349-51 — ෆැක්ස්/பெக்ஸ்/Fax : 011 - 2877 127
අමාත්‍යාංශය 1වන මහල, සෙත්සිරිපාය අදියර II,බත්තරමුල්ල.
அமைச்சு 1ஆவது மாடி,செத்சிறிபாயகட்டம்II, பத்தரமுல்லை.
Ministry 1st Floor,Sethsiripaya Stage II, Battaramulla.
විද්‍යුත්තැපැල/மின்னஞ்சல்/E-Mail : msesecretary@sltnet.lk
වෙබ් අඩවිය/இணையத்தளம்/Website:www.socialemwelfare.gov.lk

<u>මෙම ආධාරය ලබා ගැනීම සඳහා අවශ්‍ය ලිපිලේඛන</u>

- නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත (අයදුම්කරු ඇඟිලි සලකුණ යොදන්නේ නම් ග්‍රා.නි./ ස.සේ.නි./ ප්‍රා.ලේ. විසින් එය සහතික කළ යුතු ය.
- අඩු ආදායම්ලාභී පුද්ගලයකු බවට සමාජ සේවා නිලධාරී හා ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය
- එමෙන් ම ග්‍රාම නිලධාරිගේ නිර්දේශය සහිත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.
- අයදුම්කරුගේ අත්සනින් යුත් ස්වයංරැකියා ආධාර ඉල්ලීම් ලිපිය
- කලත්‍රයා මිය ගොස් ඇත්නම් මරණ සහතිකයේ පිටපතක්
  කලත්‍රයා අත්හැර ගොස් සිටී නම් විවාහ සහතිකයේ පිටපතක් සහ අත් හැර ගොස් ඇති බවට සාමදාන විනිසුරුවරයකුගෙන් ලබා ගත් දිවුරුම් ප්‍රකාශය
  කලත්‍රයා බන්ධනාගාරගතව සිටී නම් ඒ බවට බන්ධනාගාර අධිකාරි/ ජේලර්/ සුභසාධන නිලධාරීගෙන් ලබා ගත් සහතිකය
- සමාජ සේවා නිලධාරීගේ ව්‍යාපෘති වාර්තාව (අමුද්‍රව්‍ය, අලෙවිය, ස්වයංරැකියාව පිළිබඳව පවත්නා දැනුම, පුහුණුව හා පළපුරුද්ද පිළිබඳ විස්තරය)
- අයදුම්කරු විසින් සකස් කරන ලදුව සමාජ සේවා නිලධාරී විසින් නිවැරදි බව සහතික කරන ලද විධිමත් වියදම් ඇස්තමේන්තුව
- වෙළෙඳපොලකින් ලබා ගන්නා සියලු ම උපකරණ හෝ ද්‍රව්‍ය සඳහා එම ද්‍රව්‍ය මිළ දී ගත් වෙළෙඳ ආයතනයෙන් ලබා ගත් මිල ගණන් සඳහන් ලිපිය හා එම උපකරණ අන්සතු නොකර අදාළ ව්‍යාපෘතිය සඳහා ම යොදා ගන්නා බවට අයදුම්කරුගෙන් ලබා ගත් ලිපියක්
- ප්‍රාදේශීය වශයෙන් සපයා ගන්නා භාණ්ඩ සඳහා මිල ගණන් ඉදිරිපත් කරන්නේ නම් එම මිල ගණන් සාධාරණ බවට ග්‍රාම නිලධාරී/ සමාජ සේවා නිලධාරිගේ සහතිකය
- ස්වයංරැකියාව සත්ත්ව පාලනයට අදාළ නම් පශු වෛද්‍ය නිලධාරී වාර්තාව
- ඉහත සඳහන් විශේෂ අවස්ථා සම්බන්ධයෙන් වන කල්හි අදාළ ග්‍රාම නිලධාරිගෙන් වාර්තාවක් හා සාමදාන විනිසුරුවරයකු ඉදිරියේ කරන ලද දිවුරුම් ප්‍රකාශයක්

<u>සැලකිය යුතු වෙනත් කරුණු</u>

- සිල්ලර බඩු වෙළෙඳාම සඳහා අමුද්‍රව්‍ය ලබා ගැනීමට ආධාර ලබා නොදෙන නමුත් පවත්වා ගෙන යනු ලබන වෙළෙඳසලක් දියුණු කිරීම සඳහා අවශ්‍ය උපකරණ (තරාදි, අල්මාරි, මේස, පුටු) සඳහා ආධාර ඉල්ලුම් කිරීමට හැකි ය.

- සීමිත ප්‍රතිපාදන ප්‍රමාණයක් ඇති බැවින් පාසල් යන / උසස් අධ්‍යාපනය ලබන අවු. 20ට අඩු රැකියා විරහිත දරුවන් සිටින පවුල් සඳහා ප්‍රමුඛතාවය දීමට කටයුතු කළ යුතුය

- ආධාර ලබා ගැනීමෙන් පසු ස්වයංරැකියාවෙහි ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් සමාජ සේවා නිලධාරී විසින් මාස 3කට / මාස 6කට / වසරකට පසු යාවත්කාලීන කොට ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව පහත ලිපිනයට ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර එසේ ඉදිරිපත් කිරීමට නොහැකි නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ඉල්ලීම් නොසලකා හරිනු ඇත.

- යම් ව්‍යාපෘතියක් සඳහා උපකරණ ලබා ගැනීමට ආධාර දී ඇත්නම් (උදා:- මහන මැෂිම, වතුර මෝටර්, තුනපහ/හාල් අඹරණ යන්ත්‍ර ආදී) එම ආධාරලාභීන් විසින් ස්වයංරැකියාව සාර්ථක ලෙස සිදු නොකරන බව කිසියම් විටක හෙළි ගියහොත් එම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී දැනුවත් කොට නැවත සාර්ථකව එම ස්වයංරැකියාව සිදු කරන ලෙස උපදෙස් දීමටත්, තව දුරටත් ඔවුන් එම උපකරණ භාවිතයට නොගන්නේ නම් එවා ආපසු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබා ගෙන එම අවශ්‍යතාව පවතින නව ඉල්ලුම්කරුවකුගේ ඉල්ලුම්පතක් එවා අනුමැතිය ලබා ගෙන ඒ අය සඳහා එම උපකරණ ලබා දීමට සමාජ සේවා නිලධාරීට හැකි ය.

(අ.පි.බ.)

**සම්පූර්ණ කරන ලද අයදුම්පත් එවිය යුතු ලිපිනය**

අධ්‍යක්ෂ
ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය
පළමු මහල, සෙත්සිරිපාය II අදියර
බත්තරමුල්ල

**වැඩිදුර විස්තර සඳහා**

දුරකතන අංකය : 011-2877374
විද්‍යුත් තැපැල : mssnspd@gmail.com

අශෝකා අලවත්ත
ලේකම්
ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

පිටපත් :
1. සියළුම ප්‍රාදේශීය ලේකම්වරු - කාරුණික දැන ගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා
2. අධ්‍යක්ෂ සමාජ සේවා දෙපාර්තමේන්තුව - කාරුණික දැ. ගැ.ස හා අ.ක ස
3. දිස්ත්‍රික් සමාජ සේවා නිලධාරි - අදාළ අයදුම්පත මේ සමඟ එවමි.

## ஏ விதிமுறைகள்

01. අයදුම්කරු අවුරුදු 60ට අඩු වැන්දඹු හෝ ස්වාමියා විසින් අත්හරින ලද අයෙකු වීම. விண்ணப்பதாரியின் வயது 60க்கு குறைவாகவும், கணவன் அல்லது மனைவியினால் கைவிடப்பட்ட ஒருத்தராக இருத்தல் வேண்டும்.

02. පාසල් යන දරුවන් සහිත අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ./ பாடசாலை செல்லும் பிள்ளைகளை கொண்ட விண்ணப்பதாரிகளுக்கு முன்னுரிமை வழங்கப்படும்

03. තනි මාපිය පවුල් සංවර්ධන වැඩසටහන මගින් ස්වයං රැකියා සඳහා ලබාදෙන මුදල රු 30000/- ක් හෙයින් ඊට වැඩි ව්‍යාපෘති සඳහා ඉතිරි මුදල් සපයා ගන්නා ආකාරය./ தனிப்பெற்றோரை அபிவிருத்தி செய்யும் நிகழ்ச்சித் திட்டத்தின் ஊடாக சுயதொழிலுக்கு வழங்கப்படும் நிதி ரூபா.30,000/- என்பதால் அதற்கு மேலதிகமான கருத்திட்டம் தொடர்பில் மீதிப் பணத்தை பெற்றுக்கொள்ளும் முறைமை.

04. පවුලේ මාසික ආදායම පිළිබඳ ග්‍රාම නිලධාරි වාර්තාව.( අඩු ආදායම් ලාභිබවට)/ குடும்பத்தின் மாதாந்த வருமானம் தொடர்பில் கிராம உத்தியோகத்தரின் அறிக்கை (குறைந்த வருமானம் என்பதை உறுதிப்படுத்துதல் வேண்டும்.)

05. ස්වාමියාගේ/භාර්යාවගේ මරණ සහතිකයේ පිටපතක් හෝ ස්වාමියා/භාර්යාව හැර ගොස් සිටිනම් සාමදාන විනිසුරු මගින් ලබාගත් දිවුරුම්/ ප්‍රතිඥා සහතිකයක් හා විවාහ සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය. கணவன்/மனைவி இறந்திருப்பின் மரண சான்றிதழின் உறுதிப்படுத்தப்பட்ட பிரதி அல்லது/கணவன் அல்லது மனைவி கைவிட்டுச் சென்றிருப்பின் சமாதான நீதவான் ஊடாக பெற்றுக்கொண்ட சத்தியக் கடதாசி அல்லது சத்தியப்பிரமாணத்தின் சான்றுப்படுத்திய பிரதி மற்றும் திருமண சான்றிதழின் உறுதிப்படுத்திய பிரதி இணைக்கப்படல் வேண்டும்.

06. ස්වාමියා/ භාර්යාව බන්ධනාගාර ගතව සිටින බවට බන්ධනාගාර අධිකාරී/ ජේලර්/ සුභසාධන නිලධාරීගෙන් ලබාගත් සහතිකය ඇමිණිය යුතුය.
கணவன் அல்லது மனைவி சிறைச்சாலையில் உள்ளார் என்பதனை சிறைச்சாலை அதிகாரி ஜெயிலர் /நலன்புரி உத்தியோகத்தரிடமிருந்து பெற்றுக்கொண்ட சான்றிதழ் இணைத்தல் வேண்டும்.

07. සමාජ සේවා නිලධාරිගේ ව්‍යාපෘති වාර්තාව. (අමුද්‍රව්‍ය, අලෙවිය, ස්වයං රැකියාව පිළිබඳ දැනුම, පුහුණුව හා පලපුරුද්ද පිළිබඳ විස්තරය) சமூகசேவைகள் உத்தியோகத்தரின் கருத்திட்ட அறிக்கை. (மூலப்பொருட்கள், சந்தைப்படுத்துதல், சுயதொழில் தொடர்பான அறிவு, பயிற்சி, மற்றும் அனுபவம் தொடர்பான விபரம்)

08. උපකරණ වෙළඳපොලෙන් මිලදී ගන්නේ නම් එම උපකරණ මිලදී ගන්නා ආයතන වලින් ලබා ගත් මිළ ගණන් කැඳවූ ලිපි හා එම උපකරණ අන්සතු නොකරන බවට අයදුම්කරුගෙන් ලබා ගත් ලිපියක්
உபகரணங்களை சந்தையில் இருந்து கொள்வனவு செய்வதாயின் அவ்வுபகரணங்களை கொள்வனவு செய்யும் நிறுவனங்களிலிருந்து பெற்றுக்கொண்ட விலைமனுக்கோரல் கடிதம் மற்றும் அவ்வுபகரணம் கைமாற்றப்பட மாட்டாது என்பதை உறுதிப்படுத்தும் விண்ணப்பதாரியிடமிருந்து கிடைக்கப்பெற்ற கடிதம்.

09. ප්‍රාදේශිය වශයෙන් සපයාගන්නා භාණ්ඩ සඳහා මිලගණන් ඉදිරිපත් කරන්නේනම් එම මිල ගණන් සාධාරණ බවට ග්‍රාම නිලධාරි / සමාජසේවා නිලධාරි / සමාජ සංවර්ධන සහකාර /සහතික කිරීම. பிரதேச ரீதியில் வழங்கப்படும் பொருட்கள் தொடர்பில் விலைமனுக்களை முன்வைப்பதாயின் அந்த விலைமனுக்கள் நியாயமானது என்பதை கிராம உத்தியோகத்தர்/சமூகசேவை உத்தியோகத்தர்/சமூக அபிவிருத்தி உதவியாளர் / சமூக அபிவிருத்தி உத்தியோகத்தரினால் உறுதிப்படுத்தப்படல் வேண்டும்

10. ස්වයං රැකියාව සත්ව පාලනයට අදාල නම් පශු වෛද්‍ය නිලධාරි වාර්තාව./சுயதொழில் விலங்கு வளர்ப்பு என்றால் கால்நடை மருத்துவ உத்தியோகத்தரின் அறிக்கை

සමාජ සුභසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය
சமூக நலன்புரி மற்றும் ஆரம்ப கைத்தொழில் அமைச்சு

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය.
அங்கவீனமுற்றோருக்கான தேசிய செயலகம்

<u>තනි මාපිය පවුල් සංවර්ධන වැඩසටහන යටතේ ස්වයං රැකියා ආධාර ලබාදීමේ අයදුම් පත්‍රය</u>
<u>தனியொருவரினைத் தலைவராகக் கொண்ட குடும்பங்களினை புனர்வாழ்வளித்தல் நிகழ்ச்சித் திட்டத்தின் கீழ் சுயதொழில் உதவியினை வழங்குவதற்கான விண்ணப்பப்படிவம்.</u>

1. අයදුම්කරුගේ නම
   விண்ணப்பதாரியின் பெயர் ..............................
2. ලිපිනය
   முகவரி ..............................
3. උපන්දිනය
   பிறந்த திகதி ..............................
4. ජාතික හැඳුනුම්පත් අංකය
   தேசிய அடையாள அட்டை இல. ..............................
5. දිස්ත්‍රික්කය
   மாவட்டம் ..............................
6. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
   හා ග්‍රාම නිලධාරී වසම.
   பிரதேச செயலாளர் பிரிவும்
   கிராம உத்தியோகத்தர் பிரிவும் ..............................
7. වැන්දඹු(ස්වාමියා/භාර්යා, අත්හලහෝ මියගිය) ..............................
   விதவை/கணவரால் கைவிடப்பட்டவரா?..............................
8. ස්වාමිපුරුෂයා/භාර්යාව වෙන්වූයේ/මියගියේ කවදාද?..............................
   கணவன்/மனைவி இறந்திருப்பின்/பிரிந்திருப்பின் எப்பொழுது ..............................
9. සිටින ළමුන් ගණන
   தற்போது திருமணமாகாதுள்ள பிள்ளைகளின் எண்ணிக்கை ..............................

| | නම<br>பெயர் | පිරිමි<br>ஆண் | ගැහැණු<br>பெண் | වයස<br>வயது | පාසල් අධ්‍යාපනය ලබන/ නොලබන<br>பாடசாலை செல்பவர்களா? இல்லையா? | විවාහක/ අවිවාහක<br>திருமணமானவரா / திருமணமாகாதவரா |
|---|---|---|---|---|---|---|
| 1 | | | | | | |
| 2 | | | | | | |
| 3 | | | | | | |
| 4 | | | | | | |
| 5 | | | | | | |
| 6 | | | | | | |

10. දැනට යම්කිසි ස්වයං රැකියාවක නිරත නම් විස්තර සඳහන් කරන්න
    தற்போது ஏதாவது தொழிலில் ஈடுபட்டிருப்பின் விபரத்தினைக் குறிப்பிடவும்
..............................

உதவிப் பணம் எனக்குக் கிடைக்கப் பெற்றால் பிரதேச செயலாளருடாக எனக்கு வழங்கப்படுகின்ற ஆலோசனையின் பிரகாரம் சுயதொழிலினை முன்னெடுத்துச் செல்வதற்கு இணங்குகின்றேன். இப்பணத்தினை இச்செயற்பாட்டுக்கு மட்டுமே பயன்படுத்துவேன் என்றும் வேறு தேவைக்குப் பயன்படுத்த மாட்டேன் எனவும் உறுதியளிக்கின்றேன். அதனை வேறு தேவைக்காக பயன்படுத்துவது பற்றி கண்டுபிடிக்கப்பட்டால் உதவிப் பணத்தினை மீண்டும் செலுத்துவதற்கும், அப்படி மீளச் செலுத்தாவிடின் அமைச்சினால் மேற்கொள்ளப்படுகின்ற சட்டரீதியான செயற்பாட்டுக்கும் கீழ்ப்படிவதாக உறுதிமொழியளிக்கின்றேன்.

......................

දිනය திகதி

.........................................................

අයදුම්කරුගේ අත්සන/விண்ணப்பதாரியின் கையொப்பம்

19. ඉහත ගමන් මාර්ගය පිළිබඳ කෙටිසටහන් / மேற்குறிப்பிட்ட பிரயாண வழி தொடர்பான சுருக்கம்

.........................................................

.........................................................

.........................................................

.........................................................

.........................................................

දුරකතන අංකය / தொலைபேசி இலக்கம்: .........................................................

.........................................................

......................

දිනය/திகதி

.........................................................

අත්සන/ ஒப்பம்

ස.සේ නි/ස.ස ස/ස.නි/ச. சே உ/ச. அ. உ/அ.உ

20. ග්‍රාම නිලධාරි වාර්තාව/ නිර්දේශය /கிராம உத்தியோகத்தரின் **அறிக்கை/சிபார்சு**

.........................................................

.........................................................

.........................................................

දිනය/ திகதி ..........................

.........................................................

අත්සන / கையொப்பம்

(නිල මුද්‍රාව තබන්න / இறப்பர் முத்திரை இடப்படல் வேண்டும்).

21. සමාජසේවා නිලධාරි/සමාජ සංවර්ධන සහකාර/සංවර්ධන නිලධාරි(ස.සේ) නිර්දේශය சமூக சேவைகள் உத்தியோகத்தர்.׃. சமூக அபிவிருத்தி உதவியாள/அபிவிருத்தி உத்தியோகத்தரின் சிபார்சு

.........................................................

.........................................................

.........................................................

දිනය / திகதி ..........................

.........................................................

අත්සන / கையொப்பம்

(ස. සේ. නි/ ස.සං.ස./ සං.නි. නිල මුද්‍රාව තබන්න /
ச.சே உ. /ச.அ.உ/அ.உ. இறப்பர் முத்திரை பதியவும்)